ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>ඉන්දියා-ශ්‍රී ලංකා රෙදිපිළි වෙළෙඳ සංසදය</u>

INTEX ශ්‍රී ලංකා 2026 ප්‍රදර්ශනය හා සමගාමීව ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සහයෝගයෙන් සංවිධානය කරන ලද ඉන්දියා-ශ්‍රී ලංකා රෙදිපිළි වෙළෙඳ සංසදය 2026 අගෝස්තු 6 වන දින කොළඹ BMICH හිදී පැවැත්විණ. කලාපයේ ප්‍රමුඛතම ජාත්‍යන්තර රෙදිපිළි ප්‍රදර්ශනය වන INTEX ප්‍රදර්ශනය සඳහා රෙදිපිළි අගය දාමය පුරා ඉන්දියාවේ හැකියාවන් ප්‍රදර්ශනය කරමින් ඉන්දියාවෙන් ප්‍රදර්ශකයන් 80කට අධික සංඛ්‍යාවක් සහභාගී වූහ.

2. වාණිජ දෙපාර්තමේන්තුව සහ රෙදිපිළි අමාත්‍යාංශය යටතේ පවතින PDEXCIL, TEXPROCIL සහ MATEXCIL ඇතුළු අපනයන ප්‍රවර්ධන කවුන්සිලයන්ගේ සහයෝගය ඇතිව සංවිධානය කර තිබූ විශේෂ ඉන්දියා කුටියක් (Incredible Textiles of India Pavilion) INTEX ප්‍රදර්ශනයට ඇතුළත් විය. ඉන්දීය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා ද ඉන්දියා කුටිය නැරඹූ අතර එතුමා ඉන්දීය ප්‍රදර්ශකයන් සහ කර්මාන්තයේ නියෝජිතයන් සමඟ පිළිසඳරක ද නිරත විය.

3. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍ය ගරු වසන්ත සමරසිංහ මැතිතුමා සහ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු චතුරංග අබේසිංහ මැතිතුමා ඉන්දියා-ශ්‍රී ලංකා රෙදිපිළි වෙළෙඳ සංසදය ඇමතූහ. එහිදී, ඔවුහු විශේෂයෙන්ම රෙදිපිළි සහ ඇඟළුම් ක්ෂේත්‍රය තුළ ඉන්දීය අපනයනකරුවන්ට සහ ආයෝජකයන්ට පවතින අවස්ථාවන් අවධාරණය කළහ.

4. සංසදය ඇමතූ මහ කොමසාරිස්තුමා ඉන්දියා-ශ්‍රී ලංකා වාණිජ හවුල්කාරිත්වයේ ශක්තිය සහ වඩා ශක්තිමත් සැපයුම් දාම සබඳතා සහ රෙදිපිළි ක්ෂේත්‍රයේ දෙරට කර්මාන්ත අතර හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම හරහා ද්විපාර්ශ්වික වෙළෙඳාම සහ ආයෝජන තවදුරටත් ගැඹුරු කිරීමට පවතින අවස්ථා සම්බන්ධයෙන් අවධාරණය කළේය.

5. රෙදිපිළි සහ ඇඟළුම් ක්ෂේත්‍රය ඉන්දියා-ශ්‍රී ලංකා වෙළෙඳ සහ ආර්ථික සබඳතාවයේ වැදගත් අංශයකි. ඉන්දියා-ශ්‍රී ලංකා රෙදිපිළි වෙළෙඳ සංසදය තුළින් ව්‍යාපාරික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමට සහ දෙරට අතර අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභදායී සහයෝගීතාවය ඉහළ නැංවීම සඳහා නව අවස්ථාවන් ගවේෂණය කිරීමට අවස්ථාවක් ලබා දෙන ලදී.

***

කොළඹ
*2026 අගෝස්තු 08*